RUAF Foundation
RESOURCE CENTERS ON URBAN AGRICULTURE & FOOD SECURITY
www.ruaf.org

PRACTICAL ACTION
Intermediate Technology Development Group
www.practicalaction.org

IWMI
International Water Management Institute
www.iwmi.org

# නාගරික අඩු ආදායම්ලාභී කෘෂි නිෂ්පාදකයන් හා ඔවුන්ගේ වෙළෙඳපොළ ධාරිතාවය නගා සිටුවීම

## "බීජයෙන් මේසයට" - From Seed to Table( FStT) ව්‍යාපෘතිය

කෘෂි කාර්මික රටක් වශයෙන් ශ්‍රී ලංකාවට ශීඝ්‍ර සංවර්ධන ක්‍රියාවලියේ අභියෝග වලට අඛණ්ඩව අනුගත වීමට සිදුව තිබේ. බොහෝ ග්‍රාමීය ප්‍රදේශ වේගයෙන් නාගරීකරණය වන අතර බොහොමයක් ගොවීන්ට ඔවුන්ගේ ජීවිකාව පවත්වාගෙන යාම දුෂ්කර වී ඇත. රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන මගින් ග්‍රාමීය කෘෂි කර්මය නගා සිටු වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළද, බොහෝ විට නාගරික ගොවියා කෙරෙහි අඩු අවධානයක් යොමුව පවතී.

වේගවත් නාගරීකරණ ක්‍රියාවලිය විසින් නාගරික අඩු ආදායම්ලාභී ගොවි ප්‍රජාව දුෂ්කරතා වලට ඇද දමා තිබේ. කෘෂි උපකාරක සේවාවන් වෙත පහසුවෙන් ළඟා වීමේ හැකියාව ග්‍රාමීය අංශයට ඇතත් නාගරික ගොවියාට එම අවස්ථාව අහිමි වී ඇත. නාගරික කෘෂිකර්මය වෙනුවෙන් ක්‍රියාත්මක RUAF පදනම (නාගරික කෘෂිකර්මය හා ආහාර සුරක්ෂිතතාව වෙනුවෙන් වූ සම්පත් මධ්‍යස්ථානය), ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය (IWMI) සහ ප්‍රැක්ටිකල් ඇක්ෂන් ආයතනය සමඟ එක්ව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. ගම්පහ නාගරික බල ප්‍රදේශය තුළ කෘෂි නිෂ්පාදක සංවිධාන හා ඔවුන්ගේ වෙළඳපොල ධාරිතාවය ශක්තිමත් කිරීම FStT ව්‍යාපෘතියේ අරමුණයි.

මෙම ව්‍යාපෘතිය ''බීජයෙන් මේසයට'' හෙවත් From Seed to Table ලෙස නම් කොට ඇති අතර 2009/2010 දෙවසර තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. ව්‍යාපෘතිය සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වයඹ විශ්ව විද්‍යාලය සහ නාගරික හරිත බලකාය (මේ සඳහා ගම්පහ නගර සභාව සහ කෘෂිකර්ම, ගොවිජන සේවා, අධ්‍යාපන, සෞඛ්‍ය, උද්‍යාන භෝග. සත්ත්ව නිෂ්පාදන යන දෙපාර්තමේන්තු හා සණස සංගමය ඇතුළත් වේ.) සහයෝගය ලබා දේ. එසේම

ගම්පහ මහ නගර සභාව මගින් 2008 - 2012 කාලය වෙනුවෙන් නාගරික උපායමාර්ගික න්‍යාය පත්‍රයක් (City Strategy Agend) නිර්මාණය කර ඇති අතර චිරස්ථායි සංවර්ධනයක් ඔස්සේ අහාර සුරක්ෂිතතාවය සහිත පිරිසිදු, හරිත නග රයක් කරා යාම එහි අරමුණයි. මේ මගින් FStT ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු පරිසරය ලබා දෙනු ඇත.

දැනටමත් පවතින හෝ නව නිෂ්පාදන කණ්ඩායම් හරහා කෘෂිනිෂ්පාදන කණ්ඩායම් සංවර්ධනය කිරීම තුළින් මෙම වැඩසටහන ක්‍රියාත්මක වනු ඇත.

**වැඩසටහන අදියර කීපයකින් ක්‍රියාත්මක කරනු ලබන අතර එහි ප්‍රධාන පියවර ලෙසඃ**

- ඉහළ වෙළෙඳපොල ඉල්ලුමක් සහිත නිෂ්පාදනයක් තෝරා ගැනීම සඳහා සීඝ්‍ර වෙළඳපොල අධ්‍යයනය

- වඩාත් උචිත නිෂ්පාදනය (Most Promising Option/MoPO) තෝරා ගැනීම - මෙය දැනටමත් වගා කරන බෝගයක් හෝ ඔවුන්ගේ වගා තත්ව වලට සරිලන නව නිෂ්පාදනයක් විය හැකිය.

- අලෙවිකරණ ක්‍රියාවලියේදී තීරණාත්මක අංග සහ ගොවියාට ඉහළ වාසි අත්කර දීම සඳහා සිදුකළ හැකි තාක්ෂණික හා ආයතනික වෙනස් කම් හඳුනා ගැනීම.

- ගොවීන්ගේ හා ගොවි සංවිධාන වල ව්‍යවසායකත්ව ධාරිතාවය වැඩිදියුණු කිරීම සඳහා තෝරාගත් වඩාත් උචිත භෝගයේ (MoPO) නිෂ්පාදනය, සකස් කිරීම හා වෙළෙඳපොල නව්‍යකරණ අවස්ථා හඳුනා ගැනීම.

ව්‍යාපෘති සැලසුම්කරණය සඳහා සම්බන්ධ වීමට කැමැත්තක් දක්වන නාගරික නිෂ්පාදකයන්ට අප සමඟ එක්වීමට ආරාධනා කිරීමට කැමැත්තෙමු. මේ සම්බන්ධයෙන් ඇති ඔබගේ අදහස් හා යෝජනා අගේ කොට සලකමු.

## වැඩි විස්තර සඳහා පහත සඳහන් අංක ඇමතිය හැකග

- IWMI කලාපීය උපදේශක - ගම්පහ - 0714905410
- ප්‍රැක්ටිකල් ඇක්ෂන් ආයතනය - 0112829412